CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත අහෝසි කොට නව නීති පැනවීම අවශ්‍යව තිබේ

**2013 මැයි 9 වනදා, කොළඹ, ශ්‍රී ලංකාව :** විපක්ෂයේ දේශපාලනඥයෙකු වන අසාද් සාලි මහතා මෑතකදී අත්අඩංගුවට ගෙන රඳවා තැබීමත් සමගම ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත නැවතත් විවේචනාත්මක පිරික්සීමකට ලක්ව තිබේ. මෙසේ දේශපාලන විරුඬවාදීන් මැඩ පැවැත්වීම සඳහා ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යොදාගැනීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ අනෙකුත් සිවිල් සමාජ කණ්ඩායම් විසින් හෙළා දකිනු ලැබ තිබෙන අතර පහත කරුණු හා තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ත්‍රස්තවාදය වැලක්වීමේ පනත අහෝසි කරන ලෙස ද ඒ වෙනුවට අවශ්‍යතාවයක් පවතීනම් නිසි පරිදි නව නීති පනවන ලෙසද අපි නැවත වරක් දැඩිලෙස ඉල්ලා සිටිමු.

මෑත සිදුවීම් සැලකිල්ලට ගෙන විපක්ෂ නායක වරයා ස්ථාවර නියෝග 23 (2) යටතේ පාර්ලිමේන්තුව වෙත ප්‍රශ්ණයක් ඉදිරිපත් කරමින් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත අවලංගු කරන ලෙස ඉල්ලා සිටි අතර අග්‍රාමාත්‍ය වරයා විසින් එය ප්‍රතික්ෂේප කරන ලදී. සාලි මහතා සම්බන්ධ සිදුවීම හා 2008 දී සිදුවූ ජේ.එස්. තිස්සනායගම් මහතා අත්අඩංගුවට ගෙන වරදකරු කරනු ලැබීම වැනි සිද්ධීන් මඟින් පෙනී යන්නේ ''......... දේශපාලන විරුද්ධවාදීන් හා රජයට එරෙහි වන අය මර්ධනය කිරීම සඳහා රජය විසින් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතෙහි විධි විධානයන් යොදා නොගන්නා බවට අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත දෙනු ලැබූ සහතිකය කිසිසේත්ම විශ්වාසය තැබිය හැක්කක් නොවන බව හා ප්‍රජාතන්ත්‍රවාදය ගරුකරන පුරවැසියන්ගේ ශුභ වාදී ලෙස යමක් විශ්වාස කරන සුළු සවභාවය උරගා බලන්නක් ද වී ඇති බවයි. රජයේම ලියවිල්ලක්වූ ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම මඟින් වසරක කාලයක් තුළදී ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ක්‍රියාත්මක වන ආකාරය භාවිතය සමාලෝචනය කිරීමට හා එම පනතෙහි විධිවිධානයන් පිලිගත් මානව හිමිකම් සම්මතයන් හට අනුකූල වන සේ සංශෝධනය කිරීමට පොරොන්දු වී තිබූ තත්ත්වයක් තුළ මෙසේ එම පනත භාවිත කිරීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ දැඩි සැලකිල්ල යොමුව ඇත. සාලි මහතා අත්අඩංගුවට ගෙන රඳවා තැබීම ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත සීමා කිරීම් වලින් තොරව දිගටම ක්‍රියාත්මක වන බවට වන උදාහරණ ගණනාවකින් එකකි.

මෙම පනත 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ලෙස පනවනු ලැබ 1982 අංක 10 හා 1988 අංක 22 පනත් මඟින් සංශෝධනය වූවක් වෙයි. මෙම පනත එය පැනවූ දා සිටම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ආරක්ෂාකරණ බවට විධිවිධාන සලසා ඇති මූලික අයිතිවාසිකම් පුළුල් ලෙස උල්ලංඝනය කිරීමට ඉඩකඩ සලසන්නක් පමණක් නොව එය දිරිගන්වන්නක් ද වූ බව හා සමකාලීන මානව හිමිකම් ප්‍රමිතීන් සමඟ සපුරාම නොඑකඟ වන්නාවූ පියවරක් ද ලෙස ලොව පුරා හෙළා දැකීමට ලක් වූවකි. ශ්‍රී ලංකාවට ආවේනික නීතියේ ප්‍රමාදයන් සමඟ ඒකාබද්ධ වී කොට සංකීර්ණ වී මෙම පනත සියලු ජාතීනට අයත් ශ්‍රී ලාංකීක පුරවැසියන් දහස් ගණනකට මූලික සිවිල් නිදහස අහිමි කිරීමට හා ශාරීරික හානි හා මානසික පීඩාවන් පැමිණවීමට උපයෝගී කොට ගනු ලැබ ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන සංශෝධනය, <u>43 වෙනි අග්‍ර විනිශ්චයකාර වරයා (වරිය) දෝෂාභියෝගයට ලක්කොට ඉවත් කිරීම,</u> නීතිය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය දේශපාලනීකරණය කිරීම පිළිබඳව වූ සුවිශාල සාක්ෂි ගොන්න හා එහි ප්‍රතිඵලයක් ලෙස අපරාධ නීතිය අයුතු ලෙස, තෝරාගැනීම් සහිතව හා පක්ෂපාතී ලෙස උපයෝගී කර ගැනීමේ අවස්ථාවන් ඇතුළු කනස්සල්ල දනවන සුළු මෑත

කාලීන වර්ධනයන් හී සන්දර්භය තුළ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත වැනි වැරදි ලෙස භාවිත කළ හැකි ආයුධයක් අපගේ භාවිත නීතීන් අතර පැවතීම අනතුරුදායකත්වය උග්‍ර කරවන්නකි. වැඩිදුරටත්, හදිසි අවස්ථා තත්ත්වය ඉකුත් වීමත් සමගම අවලංගු වන්නට නියමිතව තිබුණු හිදිසි අවස්ථා රෙගුලාසි ගණනාවක්ම ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ පහසුවෙන් හා කාර්යක්‍ෂම ලෙස නැවත පැනවීම මඟින් දිගටම බලපැවැත්වීමට සලස්වා තිබේ. හදිසි අවස්ථා තත්ත්වයක් විධිමත් ලෙස ප්‍රකාශයට පත් කිරීමකින් තොරව හා එසේ කිරීම සමගම ක්‍රියාත්මක වන සංවරණ හා තුලනයන්ගෙන් තොරව හදිසි අවස්ථා ක්‍රියාමාර්ගයන් දිගටම පවත්වා ගෙන යා හැකි වන්නේ කෙසේද යන්න මෙමඟින් නිදසුන් සහිතව පැහැදිලි කෙරේ. යුද්ධයේදී යටත් වූවන් හා පුනරුත්ථාපනය වූවන් සම්බන්ධයෙන් වන කාර්ය රාමුව මෙම සන්දර්භය තුළ විශේෂයෙන් අවධාරණය කරනු ලැබිය යුතුවේ. එමෙන්ම යුද්ධයෙන් පසු සමගි සන්ධානය හා සමාජය සාමාන්‍ය තත්ත්වයට පත්කිරීම වෙත එමඟින් ඇතිවන වක්‍ර බලපෑම් කෙරෙහිද දැඩි අවධානයක් යොමු විය යුතු අතර 2011 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතෙහි රෙගුලාසි අභියෝගයට ලක්කළ අවස්ථාවේදී ද මෙම ගැටළු ඉස්මතු කරන ලදී.

වර්තමානයේ පවතින ආකාරයේ වන ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතක් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක කිසිසේත්ම පැවතිය නොහැකි වූවක් වන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිරතුරුවම දරූ ස්ථාවරයයි. දශක තුනක් පුරා මෙම පනත ක්‍රියාත්මකව පැවැතීම නිලවශයෙන් සාධාරණීකරණය කිරීමට හේතු පාදකවූ ත්‍රස්තවාදී තර්ජනය මුලිනුපුටා දමා ඇති වත්මන් තත්ත්වය තුළදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තමන්ගේ මෙම ස්ථාවරය දැඩි ලෙස නැවත ප්‍රකාශකොට සිටී. වැඩිදුරටත් පහත හේතූන් පදනම් කොටගෙන අප එසේ කියා සිටින්නෙමු.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මඟින් විධායකය වෙත ලබාදෙන අතිශය පුළුල් බලතල වල ස්වභාවය හදිසි අවස්ථා බලතල හා සමානවේ. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIII පරිච්ඡේදය හා මහජන ආරක්‍ෂක පනත යටතේ සාම්ප්‍රදායික හදිසි අවස්ථා බලතල සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ප්‍රකාශයට පත් කිරීම හා කාලසීමාවෙන් කාල සීමාවට පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇමැති ලබාගත යුතු වීම වැනි සීමිත අධීක්‍ෂණ කාර්ය රාමුවට පවා එම පුළුල් බලතල වල ක්‍රියාකාරීත්වය යටත් නොවන අතර බෙහෙවින් බැඳීම් රහිත වේ. එබැවින් නීතියේ අධිපත්‍යය වෙතින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත බිඳීයන පළමු අවස්ථාව වන්නේ ත්‍රස්තවාදී තර්ජන සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විධායකයට සුවිශේෂ බලතල පැවරීම පිළිබඳව වන සංකල්පීය සාධාරණීකරණයට මුල්වන සුවිශේෂී තත්ත්වයන් පිළිබඳව වූ උපකල්පනය කණපිට හැරවීමයි. මෙයින් අදහස්වන්නේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙතින් අපේක්ෂිත ස්ථාවර සුවිශේෂ බලතල පද්ධතිය සාමාන්‍යයෙන් විධායකයට එවැනි සුවිශේෂ බලතල පැවරීම පාලනය කරන ප්‍රකාශයට පත්කිරීම, දැන්වීම් කිරීම, වලංගුවන කාල සීමාවක් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සහ පාර්ලිමේන්තුවේ අධීක්‍ෂණය වැනි වැදගත් ක්‍රියාපටිපාටිමය ආරක්‍ෂණයන් සමඟ ගැටෙන බවය.

1979 දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පනවනු ලැබුයේ තාවකාලික පියවරක් ලෙස බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වැඩිදුරටත් සැලකිල්ලට ගනී. එය පනවනු ලැබුයේ එවකට දිවයිනේ උතුරු පළාතේ පැවතී අඩු උච්චතාවයකින් යුතුවූ සන්නද්ධ කැරලිකාරීත්වයේ මුල් අවධින් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වූ එවකට පැවතී රජයේ දේශපාලන හා හමුදා උපායමාර්ගයේ අංගයක් වශයෙනි. මුල් පනතේ 29 වන වගන්තිය මඟින් පැහැදිලිවම ප්‍රකාශකොට ඇත්තේ එය බලපවත්වනු ලබන්නේ වසර තුනක කාල සීමාවක් සඳහා පමණක් වන බවය. නමුත් මෙය 1982 අංක 10 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) සංශෝධන පනත මඟින් අවලංගු කරනු ලැබූ අතර එමඟින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ස්ථාවර ක්‍රියාමාර්ගයක් බවට පත්කරනු ලැබිණි. පවත්නා තත්ත්වයට නොගැලපෙන පරිදී වුවද තවමත් පනතේ කෙටි නාමයෙහි ''තාවකාලික විධිවිධාන'' යන වචන අන්තර්ගතවේ.

මෙම පනත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84 වන ව්‍යවස්ථාවෙහි අන්තර්ගත ක්‍රියාපටිපාටිය තුළින් සම්මත කරගනු ලැබීමද මෙහිදී සැලකිල්ලට ගතයුතුවේ. 84 වන ව්‍යවස්ථාව යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන පනත් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ වැඩි ඡන්දයකින් සම්මත කිරීමට ඉඩකඩ සලසන අරුම පුදුම විධිවිධානයකි. 84 වන ව්‍යවස්ථාවේ පරාසය තුළට වැටෙන එවැනි පනත්වල අන්තර්ගතය පනත පැනවීමට පෙර ශ්‍රේෂ්ඨාධිකරණයේ සමාලෝචනයට ලක්කිරීම 120(c) ව්‍යවස්ථාව මඟින් වලක්වනු ලැබේ. මෙසේ ගත්කල, තුනෙන් දෙකේ වැඩි ඡන්දයේ අවශ්‍යතාවය සැපිරෙන්නේනම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙම විධිවිධාන යටතේ මූලික අයිතිවාසිකම් ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඕනෑම විධිවිධානයකට අනුකූල නොවන නීතීන් පැනවීමට හැකිවේ. *වීරවංස එ. නීතිපති* (2000) 1 S L R 387 නඩුවේදී මාර්ක් ප්‍රනාන්දු විනිශ්චයකාරතුමා ප්‍රකාශ කළ පරිදි,

''ත්‍රස්තවාදය වැළැක්වීමේ කෙටුම්පත් පනත අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූවිට එහිවූ යම්කිසි විධිවිධානයන් මඟින් ව්‍යවස්ථා 12(1), 13(1), සහ 13 (2) හට යම් සාධාරණ මට්ටමක සීමාවන් පැනවෙන්නේද නැතිද යන්න සහ ව්‍යවස්ථා 15(7) හට (ජාතික ආරක්ෂාවේ යහපත පිණිස යනාදී) මේ මඟින් අවසර දෙනු ලැබේද යන්න අධිකරණය විසින් තීරණය කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි. කවර හෙයින්ද යත් කෙටුම්පත් පනත තුනෙන් දෙකේ වැඩි ඡන්දයකින් සම්මත කිරීමට තීරණය කරනු ලැබ ඇති බව අධිකරණයට දැනුම්දෙනු ලැබූ බැවිනි (SC S D අංක 7/79, 17.7.79). ඒ අනුව ***ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදනයන් සමඟ බොහෝ නොගැලපීම් තිබියදී,*** ව්‍යවස්ථා 84 ප්‍රකාර, තුනෙන් දෙකේ වැඩි ඡන්දයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ***සම්මත කරනු ලැබූ අතර එය නීතියක් බවට පත්විය***'' (394-395pp අවධාරණය එකතු කෙරිණි)

විනිසුරු ප්‍රනාන්දු මහතා විසින් සඳහන් කිරීමට යෙදුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධානයන් හී අන්තර්ගත වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කරනු ලබ ඇති ඉතාමත්ම වැදගත් මූලික අයිතිවාසිකම් සමහරක් වේ. සමානත්වයට ඇති අයිතිය (ව්‍යවස්ථා 12 (1)), අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, රඳවා තැබීම සහ දඬුවම් පැමිණවීමෙන් නිදහස්වීම (ව්‍යවස්ථා 13 (1) සහ (2) ) මේවාට ඇතුළත් වේ.

පුද්ගලයෙකුගේ නිදහසට අදාළ වන්නේයයි සිතියහැකි සියලුම මානව හිමිකම් සම්මතයන්ම පාහේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි විධිවිධානයන් මඟින් සම්පූර්ණයෙන්ම නොසලකා හරිනු ලැබ තිබේ. මේවාට ඇතුළත්වන ඉතාම ප්‍රමුඛ නිදහසවල් සමහරක් නම් චෝදනා ඉදිරිපත් කිරීමෙන් තොරව දීර්ඝ කාලපරිච්ඡේදයන් තුළ අවිධිමත් ස්ථානවල රඳවා තබාගැනීම, පුළුල්ලෙස රැඳවියන්ගේ අයිතීන් අහිමිකිරීම, ඉතාම දුර්වල හා නොවැදගත් ආරක්ෂණයන්ට පමණක් යටත්ව අධිකරණ ක්‍රියාදාමයන් හීදී, පාපෝච්චාරණයන් පිළිගනු ලැබීම, සාක්ෂි මඟින් තම නිවැරදි භාවය ඔප්පු කිරීමේ භාරය වගඋත්තරකරුවන් වෙත පැවරීම, වරදට සාපේක්ෂව අසාධාරණ ලෙස වැඩි වූ දඬුවම් පැමිණවීම යනාදියෙන් වන නිදහස ආදියවේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි අන්තර්ගත සීමාවන්ගෙන් තොරවූ රඳවා තබාගැනීමේ බලතල, විශේෂ නඩු විභාග ක්‍රියාපටිපාටීන් සහ අර්ථාන්විත අධිකරණ සමාලෝචනයක් නොමැතිවීම යනාදිය මඟින් වධ හිංසා පැමිණවීම ඇතුළු අත්තනෝමතික සහ හිතුවක්කාරී නිලධාරී හැසිරීම් වලට ඉඩකඩ සැලසේ. පුවත්පත් හා අනෙකුත් ප්‍රකාශනයන් මුද්‍රණයකිරීම, ප්‍රකාශයට පත්කිරීම හා බෙදාහැරීම සඳහා ඇතැම් අවස්ථාවලදී රජයේ අනුමැතිය අවශ්‍ය කිරීම මඟින් අදහස් ප්‍රකාශනයේ හා මාධ්‍යයේ නිදහසටද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මඟින් බරපතල බාධනයන් සිදුකරනු ලැබේ. මෙම හේතු නිසා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මඟින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පිළිවෙල රඳාපවතින්නේයයි කියනු ලබන නීතියේ ආධිපත්‍යය අසාමාන්‍ය හා අහිතකර වෙනසකට ලක්කරන අතර එමඟින් ක්‍රමානුකූල මානව හිමිකම් අපයෝජනයකටද මගපාදයි. එම පනත ක්‍රියාත්මකවීම මඟින් විශේෂයෙන්ම අශෝභන ආකාරයේ ජනවාර්ගිකත්වය මත පදනම් වූ වෙනස්කම් කිරීමක්ද ඉස්මතු වී ඇත.

**අද පවතින ආකාරයට වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසිකරණ ලෙසත් එබඳු පනතක අවශ්‍යතාවයක් ඇත්නම් අදාළ එක්සත් ජාතීන්ගේ ලියවිලි හා ඒහා අනුරූප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය භාවිතයන් මඟින් නිරූපනය වන ත්‍රස්තවාදයට එරෙහි ජාත්‍යන්තර ප්‍රමිතීන් හා ගැලපෙන නීතිකරණයන් මෙම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට පනවන ලෙසත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉල්ලා සිටී.** එබඳු නීතිකරණයන් ප්‍රජාතාන්ත්‍රික සමාජයක අරමුණු හා සමානුපාතික වන, අවශ්‍ය හා සුජාත ත්‍රස්ත විරෝධී බලතල වල තිබිය යුතු අවශ්‍යතාවයන් සපුරන්නාවූ නීතිකරණයන් විය යුතුමය. එමෙන්ම ඒවා පූර්ණ අධිකරණමය සමාලෝචනයකටද යටත්විය යුතුය. මේ සම්බන්ධයෙන්, 2006 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරගත් ගෝලීය ත්‍රස්ත විරෝධී උපාය මාර්ගයෙහි (Global Counter Terrorism Strategy) දක්වා ඇති වැදගත් මූලධර්මය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සැලකිල්ලට ගනී.

''..... සියලු දෙනා සඳහා වූ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සහ නීතියේ ආධිපත්‍යය, උපායමාර්ගයේ සියලු සංඝටකයන් සඳහා අත්‍යවශ්‍යවේ. එහිදී ***ඵලදායක ත්‍රස්ත විරෝධී පියවරයන් සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම එකිනෙක හා ගැටෙන අරමුණු නොවන බවත්, එකිනෙක ඌණපූරණය කරගන්නා හා අන්‍යෝන්‍ය ලෙස ශක්තිමත් කරගන්නා සංසිද්ධීන් වන බව*** හා ත්‍රස්තවාදයේ වින්දිතයන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම අවධාරණය කළ යුතු බව'' (අවධාරණය එකතු කරණ ලදී.) මෙම යහපත් සංකල්පීය පූර්ව නිගමනය ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය නම්වූ ගැටළුව සමඟ කටයුතු කිරීම සඳහා අනාගතයෙහිදී පනවනු ලබන සියලු නීතිකරණයන්ගේ පදනමෙහි අන්තර්ගත විය යුතුය.